

# සුනාමිය බලන්න එන්න පැරෑලියට



මෙයට වසර දෙළහකට පෙර සිදුවූ සුනාමි ව්‍යසනය අත් නොදුටු පරපුරක් අද අපේ රටේ වෙසෙති.සුනාමිය සහ එවැනි ආපද පිළිබඳව මතු පරපුර දැනුවත් කිරීමත්, සුනාමිය පිළිබඳ මතක සටහන් සුරක්ෂිත කිරීම පිණිසත් හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් පැරැලිය තෙල්වත්තේ ගාල්ල - කොළඹ මහා මාර්ගයට මුහුණලා ප්‍රජා සුනාමි කෞතුකාගාරයක් සහ අධ්‍යාපන කේන්ද්‍රයක් පිහිටුවා තිබේ.

2012 වසරේ පැවති සුනාමියෙන් පැරැලිය තෙල්වත්ත ප්‍රදේශය දැඩි පීඩාවට පත්විය. එම අවාසනාවන්ත දින කොළඹ සිට මාතර දක්වා ධාවය වෙමින් තිබූ අංක 50 දරණ දුම්රිය සුනාමි රළ පහරට හසුව පෙරළී ගියේය.මේ හේතුවෙන් මෙම ප්‍රදේශයේ පුද්ගලයින් රැසක් සමග දුම්රියේ ගමන් කරමින් සිටි දහස් ගණනකගේ ජීවිත විනාශවී ගියේ පැරැලිය තෙල්වත්තේදිය ඒ කාලයේදීම සුනාමි අනතුරු ඇගවීමේ මධ්‍යස්ථානයක් පැරැලිය තෙල්වත්තේ දී ආරම්භ වූයේ ප්‍රදේශයේ ජනතාවට සුනාමි අනතුරු ඇගවීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් නොමැති අවස්ථාවකදීය.එවකට මෙම ප්‍රදේශයේ සහන සේවා සැපයූ ස්වේච්ඡා සේවක කණ්ඩායමේ ශ්‍රී ලාංකික වෛද්‍ය තොවිල් විජේසේකර සහ ඇමරිකාවේ වාසය කරන ඕස්ට්‍රේලියානු ජාතික ඇලිසන් තොමසන් මෙනවිය විසින් මෙම ප්‍රජාපාදක ආපද කළමනාකාරණ වැඩ සටහන ආරම්භ කරනු ලැබුවේ ප්‍රදේශයේ ජනතාවට රජය විසින් ලබා දෙන සුනාමි අනතුරු ප්‍රජා මට්ටමින් බෙද හැරීමටත් ආපද පෙර සූදනම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමත් අරමුණු කොට ගෙනය.

එකී වැඩසටහනේ විකාශනයක් ලෙස ප්‍රජා සුනාමි කෞතුකාගාරය සහ අධ්‍යාපන කේන්ද්‍රය පැරැලිය තෙල්වත්තේදී ආරම්භ කරනු ලැබුවේ ශ්‍රී ලාංකික ජනතාවට සුනාමිය ඇතුළු ආපද පිළිබඳ දැනුවත් කිරීමත් සුනාමියේ මතක සටහන් ඉදිරි පරම්පරා සඳහා සංරක්ෂණය කිරීමත් උදෙසාය.මෙම කෞතුකාගාරය අපද පිළිබඳ දැන්වත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ප්‍රථම සහ එකම කෞතුකාගාරය වේ.සුනාමියක් හට ගන්නා ආකාරය,සුනාමියක් පිළිබඳ පෙර ඇගවීම් ලබා දෙන ආකාරය සහ සුනාමියට පෙර සූදනම් වන ආකාරය ආදිය වර්ණවත් ජායාරූප සහ ආදර්ශක උපයෝගී කරගෙන ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රදර්ශන මැදිරියක් ද වෙන්කර ඇත.

මෙම මැදිරිය සකස් කිරීමේදී ඇමරිකා එක්සත් ජනපදයේ හවායි පිහිටා ඇති පැසිපික් සුනාමි කෞතුකාගාරයේ උපදේශක සහ හවායි විශ්ව විද්‍යාලයේ සමුද්‍රික විද්‍යා පිළිබඳ මහාචාර්ය ඩෑලි මහතාගේ විශේෂ තාක්ෂණික සහාය ලැබී තිබේ. තවද ඇමරිකා එක්සත් ජනපදයේ හවායි පිහිටා තිබෙන පැසිපික් සුනාමි කෞතුකාගාරයෙන් ප්‍රදනය කළ සුනාමි පිළිබඳ දුර්ලභ ජායාරූප එකතුවක් ද මෙම කෞතුකාගාරයයේ ප්‍රදර්ශනය කෙරේ.විශේෂයෙන්ම ස්වාභාවික ආපද පිළිබඳ පාසල් විෂය මාලාව තුලට ඇතුලත් කර ඇති මෙවන් සමයක් මෙම කෞතුකාගාරය පාසල් දරුවන් වෙත සුනාමිය ඇතුළු ආපද පිළිබඳ තොරතුරු සපයනු ලබයි.

2014 සුනාමියේ දුර්ලභ ජායාරූප රැසක් ද මෙම කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත.සුනාමියේ සිදුවූ මහා විනාශය සැසින් නුදුටු අයෙකුට ඒ පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකි වන පරිදි ප්‍රදර්ශන මැදිරි මෙහි ස්ථාපිත කොට ඇත.ආපදවකින් පසුව දේශීය සහ විදේශීය ස්වේච්ඡා කණ්ඩායම් ඉටු කරන කාර්ය භාරය අප්‍රමාණය.එම ස්වේච්ඡා සංවිධනවලට උපහාරයක් ලෙස ඔවුන්ගේ සේවය දක්වෙන සුවිශේෂී මැදිරියක් ද මෙම කෞතුකාගාරය තුළ ස්ථාපිත කොට තිබේ.



ඇලිසන් තොමසන්



වෛද්‍ය තොවිල් විජේසේකර

ප්‍රජා සුනාමි කෞතුකාගාරය ආශ්‍රිතව පිහිටුවා තිබෙන ප්‍රජා සුනාමි අධ්‍යාපන කේන්ද්‍රය මගින් සුනාමි සහ අනෙකුත් ආපද පිළිබඳ පාසල් සිසුන්,ප්‍රජාව,ප්‍රජා සංවිධාන,ආගමික සංවිධාන,විශ්ව විද්‍යාල සිසුන් සහ වෙනත් කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් ද මෙහි ක්‍රියාත්මක වෙයි.මෙම වැඩ සටහන් ජාතික මට්ටමේ සහ දිස්ත්‍රික් මට්ටමේ ආපද කළමනාකරණ ආයතනයන් හා සම්බන්ධීකරණයෙන් සිදු කෙරේ.පාසල් සිසුන් සහ විශ්ව විද්‍යාල සිසුන් සඳහා සුනාමි සහ ආපද පෙර සූදනම පිළිබඳ කෙරෙන පර්යේෂණ සහ ව්‍යාපෘති සඳහා ප්‍රජා සුනාමි කෞතුකාගාරය ආශ්‍රිත අධ්‍යාපන කේන්ද්‍රය මගින් සහාය ලබාදීමක් ද සිදු කෙරේ.දේශීය සහ විදේශීය සංචාරකයින් සඳහා සෑම දිනකම පෙරවරු 8 සිට පස්වරු 8 දක්වා සුනාමි කෞතුකාගාරය නොමිලේ විවෘතව පවතී.





සටහන සහ ජායාරූප
@අම්බලන්ගොඩ සමූහ
ආර්.ඥාණදාස

